**ශීර්ෂය 302, සමූපකාර සේවක කොමිෂන් සභාව**

**----------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 302 - සමූපකාර සේවක කොමිෂන් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමූපකාර සේවක කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2024මැයි 06 දින ගණන්දීමේ නිළධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූනි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට සමූපකාර සේවක කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි. ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) ආදායම් නොවන ලැබීම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වර්ෂයේ තැන්පතු ලැබීම් සහ ගෙවීම් රු.106,868 ක් වැඩියෙන්ද, අත්තිකාරම් ගිණුම් ලැබීම් සහ අත්තිකාරම් ගෙවීම් රු. 106,868 ක් අඩුවෙන් ද දක්වා තිබුණි. | ඉදිරියේදී අදාළ ගිණුම් සටහන් භෞතික හා පරිගණක යන පද්ධතියන් දෙකෙහිම නිවැරදිව ඇතුළත් කිරීමට හා මූල්‍ය ප්‍රකාශන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අනුව සකස් කිරීමට නිලධාරින් හට උපදෙස් ලබා දෙන ලදී. | මාර්ගෝපදේශය ප්‍රකාරව ගිණුම් පිළියෙල කළ යුතුය. |

**(ආ) දේපල පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2023 මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ වත්කම් සංකේතාංක 2ක් සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයේ අවසන් ශේෂයන්ගේ එකතුව රු.3,846,407ක් වුවද සමාලෝචිත වර්ෂයේදී එම සංකේතාංකයන්හි ආරම්භක ශේෂයන්හි එකතුව රු. 3,416,990ක් ලෙස රු.429,417 ක් අඩුවෙන් දක්වා තිබුණි. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. 2022 භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් නිර්දේශ කර 2023 වර්ෂය තුල වෙන්දේසි කරන ලද භාණ්ඩ වල පිරිවැය රු.429,416.88කි. එම වරද භාණ්ඩාගාර ගිණුම් දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී නිවැරදි කර ගැනීමට අතපසුවී ඇත. ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවන ලෙස කටයුතු කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |

(ඇ) **අත්තිකාරම් ගිණුම් ශේෂ**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාණ්ඩාගාර පොත් අනුව 30201 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ මුදලින් වර්ෂය තුල හර කිරීම් හා බැර කිරීම් පිළිවෙලින් රු.878,808 ක් හා රු.735,139 ක් වුවද **ACA** 5 ආකෘතියේ රු.771,940 ක් හා රු.628,271 ක් ලෙස රු.106,868 ක් අඩුවෙන් හර හා බැර කර තිබුණි. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. | නිවැරදිව ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැය විෂයය 1301, 1302 සහ 1303 හි පිළිවෙලින් සියයට 60 ක් 82 ක් සහ 100 ක් ලෙස ඉතිරිවීම් පැවතීමෙන් මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව තාත්වික ලෙස ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි. | නඩත්තු හා අළුත්වැඩියා වියදම් සහ ණය පෙොලි අපේක්ෂා කල පරිදි වර්ෂය තුල ඇති නොවීම | තාත්විකව ඇස්තමේන්තු පිළියෙල කල යුතුය. |

### 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාල රු.33,440 ක විදුලි බිල බැරකම් ලේඛනයේ හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුලත් කර නොතිබුණි. | විගණනය දක්වා ඇති විදුලි බිල 2023.12.08 සිට 2024.01.08 දක්වා වන කාලසීමාවට අදාල වන බැවින් බැරකම් ලේඛනයට ඇතුලත් කිරීමට කටයුතු කර නැත. | වර්ෂයට අදාල බැරකම් නිවැරදිව දැක්විය යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2020 ට අදාළව නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 12 (අ) ප්‍රකාරව අදාළ වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්යය මණ්ඩලය සහ දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර සහ (ඇ) ඡේදය අනුව වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත කර නොතිබුණි. | අදාළ වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර සහ වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍ය සැලැස්ම සකස් කර තිබුණ ද 2023 ක්‍රියාකාරි සැලැස්ම සමග ඉදිරිපත් කර නැත. | මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

### 3. 2 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 හා 2022 වර්ෂවල ලැබී විසඳා නොතිබුණු අභියාචනා 13 ක් සම්බන්ධව 2023 වර්ෂයේදී විසඳුම් ලබා දී තිබුණු අතර 2023 වර්ෂය තුල ලද පැමිණිලි 20 කින් 16 කට පමණක් විසඳුම් ලබා දී තිබුණු අතර විසඳුම් ලබා දිය යුතු අභියාචනා 04 ක් තවදුරටත් පැවතුණි. | සේවක අභියාචනයක් ලැබීමෙන් පසුව එම අභියාචනයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් විස්තර වාර්තාවක් සමිතියෙන් කැඳවීම සිදු කෙරේ. කොමිෂන් සභාවට තොරතුරු ලබාදීමට ප්‍රමාද වීම වැනි කරුණු හේතුවෙන් ඇතැම් අභියාචනා කඩිනමින් විභාග කර අවසන් කිරීමට නොහැකි වී ඇත. | ප්‍රධාන කාර්යයන් කඩිනමින් ඉටු කිරීමට කටයුතු කළ යුතුය.. |

## 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොමිෂන් සභාව සතුව වාහන 03 ක් පවතින අතර අනුමත රියදුරු සංඛ්‍යාව 03 ක් ලෙස පැවතුණි. එසේ වුවද තත්‍ය කාර්ය මණ්ඩලය තුල එක් රියදුරෙකු පමණක් සිටීම හේතුවෙන් සංචිත ධාවනයේ යෙදෙන වාහන 2 ම ඌන උපයෝජිතව පැවතුණි. | රියදුරු පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට අවස්ථා කිහිපයක දීම ඉල්ලීම් කර ඇතත් ඒ සඳහා රියදුරන් අනුයුක්ත නොකිරීම හේතුවෙන් කාර්යාලයේ සංචිත වාහන විධිමත්ව ධාවනය කිරීම අපහසුවී ඇත. | වත්කම් නිසි පරිදි කළමනාකරණය කළ යුතුය. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ කිලෝමීටර 25000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසු නැවත ඉන්ධන දහන පරීක්ෂාවක් කළ යුතු වුවද ආයතනයේ වාහන සම්බන්ධව එවැනි ඉන්ධන දහන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | ඉදිරියේදී ඉන්ධන දහන පරීක්ෂාව විධිමත් පරිදි සිදු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබාදී ඇත. | වත්කම් නිසි පරිදි කළමනාකරණය කළ යුතුය. |